35 වන පිටුවෙන් (ගිමන් හරින්නා සහ)

මලක් ම ”

ප්‍රවේශපත් විකුණන්නාගේ සුරත ඔහුගේ සුදු කමිසයේ උරහිස මත රැඳී තිබුණි. උරහිස තදින් මිරිකනවා ඔහුට දැනුණි.
පසුම්බිය වෙත ඇඳි යන අත නතර කළ ප්‍රවේශපත් විකුණන්නා මෙසේ පැවසී ය.
“ ටිකට් ඕන්නෑ. මල්ලි යන්න. ඕන දවසක. ඕන වෙලාවක.”

5

“නිදහස් ප්‍රේම පාරාදීසය” ලෙස ඔහු යළිවරක් ඉසුරුමුණි පිළිබඳ පළල් සංඛේතකරණයට පිවිසුණි. ඉසුරුමුණි ප්‍රේම කාව්‍යය අනුරාධපුරයේ පාසල් අතර ප්‍රකට රහසිගත ප්‍රේම වෘත්තාන්තයක් ව පැවතුණි.

ගිමන් හරින්නාගේ දැසත් මිත්‍ර අග්වයාගේ දැසත් සංකීර්ණ ස්වරූපයක් ඉසිලූයේ ඔහු සමාධි සෙල්ලමේ නිරත වන විට පමණක් බව මේ වන විට ඔහුට තේරුම් යමින් තිබුණි. නීලා සමග ප්‍රේමයේ ගැලුණු ඕනෑම නිමේෂයක ගිමන් හරින්නා දෙස බැලීමට ඔහු කීය විය. ගිමන් හරින්නා දෙස බැලූ හැමවිට ම ඒ දෑසේ වූයේ උපේක්ෂා සහගත සෝපහාසයක් බව ඉඳුරා ම ප්‍රත්‍යක්ෂ විය. ඔහු වඩාත් ම හැකිලුණේ දෙතොලතරෙහි වූ මන්දස්මිතය නිසාවෙනි.

ඒත් ඔහුට නීලාගේ ප්‍රේමය අත් හැරීමට නොහැකි ව තිබුණි. ඔහුගේ ස්නේහය කිසිදාක නොසිඳෙන නිසා වැව සේ ම විය. එහෙත් ප්‍රේමය පිණිස ඉසුරුමුණි යෑම ඔහු අත්හළේ ය. එතැන් සිට නීලා හමු වීමට තේගිස්ගේ නිල පැල කොටයට යාමට ඔහු නුරු විය.

නීලා සමග කලා වෑ කණ්ඩියේ නුදෙකලා වූ ඇතැම් මොහොතක ගිමන් හරින්නාගේ සෝපහාසාත්මක දැස තමා වෙත එල්ල වී ඇති අයුරු දැක ඔහු නන්නාඳුනන හීතියකට පත් විය. හිතේ චකිතය දුරු කර ගනු වස් ඔහු සමාධි සෙල්ලමේ ගිය කිසිවිටෙකත් ගිමන් හරින්නාගේ දැස තමාට හිනාවෙන බව ඔහුට පෙනුණේවත් හැඟුනේවත් නැත .

6

ඔහුගේ විවාහය වහකඳුරු මෙන් විය.

ඔහු කොළඹට සේන්දු වූයේ රූපවාහිනී නාලිකාවක නිවේදන වෘත්තිය පිණිස තෝරා ගැනුණු බැවිනි. ගිමන් හරින්නා හේතුවෙන් සමකාලීන ශිෂ්‍ය ප්‍රජාව අතර ජනප්‍රියව සිටි ඔහු චතුර කතිකත්වය හේතුවෙන් සමස්ත ප්‍රෙක්ෂක ප්‍රජාව අතර ම ජනප්‍රිය චරිතයක් බවට පත් ව සිටියේ ය. ඔහුගේ කථිත්වය හේතුවෙන් ගිරා පෝතකයෙකු නොව බරසාර වෘත්තිකයෙකු බව ඔහු පෙන්වාදෙයෙන් සහෝදර වෘත්තිකයන් අතර ගෞරවපූර්වකභාවයක් ඔහු කෙරෙහි පැවතුණි.

ඔහු කොළඹට ඇබබැහි විය. ප්‍රවෘත්ති හා සමාජ සංසිද්ධි ගවේෂණයෙහි පෙළහර පෑ නිවේදිකාවක විසින් ඔහුගේ ප්‍රේමය ගවේෂණය කිරීමට පෙළඹීම කෙළවර වූයේ ඔහුට වහකඳුරු වූ විවාහය සමගිනි.

ඔහු විසින් විරචිත ගේය පද ගුවනට මුසුවීම පවා ඇ පිළිකුල් කළේය. ඇගේ ඊර්ෂ්‍යා සහගත ප්‍රේමයේ කුඩප්‍රාජ්පිය තුළ ඔහුට ගී ලිවීම තහනම් කෙරුණි. අනුරාධපුරය ඔහුට තහනම් කලාපයක් විය.

නිසාවැව තරම් වන සේ නීලාට තිබූ ප්‍රේමය සිහි වී ඔහුගේ හදවත හඬා වැටුණි. එතැන් සිට නිසාවැව සේ නොසිඳී පැවතුණේ ඔහුගේ හදවතේ තෙරපෙනා කම්පාවයි. එය නිතරම හදවතේ සැලී තැගී ය.

නිවේදන ප්‍රේමය තුළ ඔහු නිවේදිකාව අභියස දිගහැරි ප්‍රේමයේ අතීත සෞන්දර්යය පාරාවළල්ලක් සේ ම විටින් විට ඔහු වෙත ඇදී එමින් තිබුණි.

“කොහෙද තමුසෙ යන්නේ ? ඉසුරුමුණියෙය නැවිටිච්චි බලන්නද? මං හොයා ගන්නම් ඔකි කවිද කියලා ”

ඇය එසේ බිණුව ද නීලාගේ දෑසේ පහස අත්හැරී ගියේ කොළඹ ආ මුල් අවදියේ සිට ම බව දත් ඔහුගෙ ' සිත ව්‍යාකූල විය. බිරින්දෑගේ බිණුම් ඒ ව්‍යාකූල හැඟුමට සාපේක්ෂව සැළකිය යුතු තරමිවත් නොවිණ. කාත් කවුරුවත් නැති නිවසක තම එකම දියණිය සමග නුදෙකලා වීමට තරම් අවකාශ සළසා දුන් තේගිස්ගේ විශ්වාසයේ දෑස සිහි වී ඇතැම් විට ඔහු හැඳුම්බර විය. නිවේදිකාව සිතුවේ තමාගේ බැණුම් දරාගත නොහැකිව ඔහු දෑසින් කඳුළු වැගිරෙන බව ය. ඇය තව තවත් ඉන් උද්යෝගිමත් වූවා ය. වෙනත් ප්‍රවේශයකින් බිණුම් ඇරඹුවා ය.

“අර අහිංසකයා, අහිංසක මුරකාරයා උගේ කෙල්ලත් අමාරුවෙ දාපු මහ ලොකු ගිමන් හරින්නා”

ඔනෑම කුණු බැනුමකට ඔනෑම කෙනෙකු හවුල් කර ගත්ත ද ඔහුට කම් නැත . ඒත් ගිමන් හරින්නා සිහිපත් කරලීමට ඔහු එකඟ නැත. නීලාට සිදු කළ හේතු විරහිත සමුදීම ගිමන් හරින්නා අනුමත නොකළ බව ඔහු දනී. එතැන් සිට ඔහු පසු පස හඬා ආයේ ගිමන් හරින්නා ගේ වේදනාවෙන් ඇවිලුණු දෑසයි. ඔහු ඊට මහත් සේ බිය විය.

එහෙත් ආනන්තරීය පාපකර්මයක් වූ විවාහයේ නන්නත්තාර ආතතිය සමනය කරනු පිණිස ඔහු යළි සමාධි සෙල්ලමට පසු බැස ගියේ ය.

ඉසුරුමුණියේ ඉඳු කුටිය අසබඩ දක්නට වූයේ ඔහු පසුපස වේදනාවෙන් ඇවිලෙන දෑසින් හඬා එන්නා වූ ගිමන් හරින්නා නොවේ.

එවර ඔහුට ගිමන් හරින්නා කෙරෙන් දක්නට ලැබුණේ විරහවේ සංතාපයෙන් ඇලලුණු නිවී සැනසුණු දෑසකි.

7

පෙමින් ආතුර
ගිලන් මගියා මා නොවේ
ගිමන් හරිනා
ඉසුරුමුණියේ විල් තෙරේ
මිතුරු තුරගා කැටුව නික්මෙමි සකිසඳේ
ඔබට පවරා ජීවිතේ

තිසා වැ කණ්ඩියේ දිදුලයි
මලානික සඳකැන්
මුලා වූ සිත මගේ පාවෙයි
වළාවන් අතරින්
නෙළාපන් සකි මගේ මහනෙල්
මලේ නිල් දැනුවන්

සිතින් නික්මෙන විරහා තාපය තැවරිලා
මෙළෙක් වූ හැටි බලන් ගල්තුළ ළං වෙලා
නෙළන් නුඹ එහි නුඹේ ප්‍රේමය සිත්තරා

රුවන්වැලි සෑ කොත් කැරැල්ලේ තැවරිලා
ගිමන් හරිනා වෙසින් වැළපෙයි පුන්සරා
අරන් කඳුළැල් නගන් පෙළහර සිත්තරා

ගීතය කියවා බැලූ ඔහුගේ හොඳම මිතුයා වූ සිත්තරා ගේ මුහුණ සෞන්දර්යයෙන් අනුන වාහකුල ප්‍රහර්ෂයකින් ඇවිලී ගියේ ය. සිත්තරා එය නැවත නැවතත් දැසින් අතපත ගා බලන්නට විය. මුල සිට අගටත් අග සිට මුලටත් මැදින් මැදිනුත් අවදි වගෙයි.

“වැඩේ මරු. ගනිම ගනි. ලස්සනයි. ඒත් මොකක්ද ලිහා ගන්න බැරි අවුලක් තියෙනවා. මොකක්ද මන්දා” අවසන සිත්තරා පැවසීය.

“මේක කියවන්න ඕනා සුනිල් ඥිරිසිංහගෙ වගේ නිවුණු හඬකින්. මේකේ තියෙන්න ඕන නිව්වච විරහවක් ” ඔහු පිළිකුරක් වෙනුවට කරළියට ගෙනාවේ හැඟීමකි.

“මේක තේරෙයිද? මං අහන්නේ මිනිස්සුන්ට, අහන අයට” සිත්තරාගේ ව්‍යාකූල සිත වචන බවට පෙරලුණි.

“මේකයි ” ඔහු නැවතත් හැඟුම්බර වෙමින් සිටියේය. “ ඔය නොපෙරෙනකම සාකච්ඡාවක් බවට පත්වෙනවට මං කැමතියි”

“උඹට ඔක මලුවට ආවෙ කොහොමද?” මිතුයාගේ ඉසුරුමුණි ඉතිහාසය නොදත් සිත්තරා දුම් වැටියක් දල්වා පොල්කටු අළු බඳන තුළට ගිනිකුර අතැර දැමීය.

ඉසුරුමුණියේ කලා භාවිතය පිළිබඳ දැනුමින් කෙළ පැමිණ සිටි සිත්තරා මෙතරම් සරල ප්‍රශ්න නගන්නේ ඇයිදැයි ඔහුට ප්‍රහේලිකාවකි. මිත්‍ර සිත්තරා අඹු මෙමුයුවලගේ අනුරුව දෙස ඔහු නෙත් අයා ගෙන සිටියේ ය. එය බොහෝ සෙයින් සැබෑ නිර්මාණයට ළඟා වූවක් විය. එහි බිඳුණු සුළැඟිල්ලක් වී නම් මෙහි ද එසේ ම බිඳී තිබුණි. කලා මංකොල්ලකරුවෙකුට අවැසි වී නම් සැබෑ නිර්මාණය සමග මෙය මාරු කරලීම එතරම් අපහසු කාර්යයක් නොවන බව ඔහුට සිතුනි. අනුරුව එතැන තැබුවට කිසිවෙකුත් සැක නොකරනා තරමට එය අංග සම්පූර්ණ විය.

එහෙත් එවර ඔහු පෙළෑ සදාතනික ප්‍රශ්නාර්ථය යළිත් හිත තුළ විදුලි කොටන්නට විය. පෙමි යුවල එතරම් ජනප්‍රිය වූයේ එතැන යුවලක් සිටින නිසාවෙන් නොවේද? ඇගේ තුණු සපුව විදීමෙහි ලොල් වූ ගවේෂක විචාරක අහින නිසා නොවෙ ද? පෙමි යුවල ගල්තුළෙන් වෙන් කොට කෞතුකාගාරයේ තුළ තැන්පත් කරන ලද්දේ එ නිසාවෙන් නොවෙද?

එහෙත් ඉසුරුමුණියේ වඩාත්ම සංකීර්ණ නිමැවුම ගිමන් හරින්නා නොවෙ ද? ගල් කුලෙන් මුදා කෞතුකාගාරයට කුළට කැඳවා නොගන්නේ ගිමන් හරින්නා අග්වයෙකු සමග සිටිනා නිසාවෙන් ද?

තමා ගීතයට නැගුවේ මේ වේදනාව නොවේදැයි ඔහු සිතන්නට විය.

මිත්‍ර සිත්තරා බී අවසන් කළ දුම්වැටියේ ෆිල්ටරය පොල්කටිට කුළ සඟවා ලිය. ඉන් නැගෙන අවසාන දුම් දාර අතින් ගසා බසා දමමින් ඔහු පෙර ප්‍රශ්නය ම නැගීය.

“ඉසුරුමුණිය ගැන ලියවෙන කොට ලියවෙන්න ඕනා ප්‍රේමය ගැන. උඹ විරහව ගැන ලියනවා උඹට ඔක මලුවට ආවෙ කොහොම ද?” ඔහු ජීවිතේ පළමු වතාවට දුම් වැටියක් දැල්වීය. රා මතින් සිටි පාසල් අවදියෙන් දුමින් ආතුර නොවුණු පෙනහලු යුග්මයේ සියලු කේෂ නාලිකා හරහා නිකොටින් ආශ්වාදය පැතිර ගියේය. ඔහු දීර්ඝ ප්‍රාශ්වාස දුම් දාරාව ඉසුරුමුණි පෙමියුවල වෙත මුදා හැරීය.

“මං කලා විනුහයකට යන්නෙ නෑ” ඔහු කතාව ඇරඹීය. “මං මගේ සිංදුව ගැන කියන්නම්” සිත්තරා සාලය මැද හිටවා වසා දමා තිබූ සිත්තම ඇර සිතින් කැන්වසය මත තීන්ත තැවරීමට යළි ඇරඹූ නමුත් දෙසවන් ඉස්සී ඉස්සී තිබුණේ ඔහුගේ ඉසුරුමුණි කටහඬ වෙතය.

“මං ඉසුරුමුණියෙය කැමතිම රූපෙ අග්ව හිසයි ගිමන් හරින්නායි” ඔහු දිගටම කියාගෙන යමින් සිත්තරා අසල පුටුවකට බරවිය. “මට හිතෙන්නේ පෙමි යුවළ අතර තිබෙන කාන්තා සෞන්දර්යය ගිමන් හරින්නාගේ බිරිඳගෙ නැත්නම් පෙම්වතියගේ කියලා. සිත්තරා එමෙම නැත්නම් ගල්වවුවා ගිමන් හරින්නාගෙ මිතුයෙක්. ඒ දෙන්නා යාළුවෝ හරියට අපි දෙන්නා වගේ. දවසක් සිත්තරාගේ කලාත්මක ප්‍රාතිභාර්යය පෙන්නන්න ගිමන් හරින්නා ඔහුගේ බිරිඳව නැත්නම් පෙම්වතියව එක්කත් එනවා. සිත්තරාගේ කලාත්මක ප්‍රතිභාවෙන් ඇය වශීකෘත වෙනවා. සිත්තරාගේ පෞරුෂය ඉදිරියේ ඇ අසරණ වෙනවා. මේ හරහා ඔවුන් අතර මානුෂීය සම්බන්ධතාවක් ගොඩනැගෙනවා. අවසානයේ ඒක ප්‍රේමයක්. එත් මේක ගිමන් හරින්නා දන්නේ නෑ”

පුටුවෙන් නැගී සිටි ඔහු තවත් දුම් වැටියක් ගෙන පෙමියුවළ අභියස කල්පනාවේ නිමග්න වෙමින් එය දල්වා ගත්තේ ය. සිත්තරාට තවදුරටත් වසා තිබුණු කැන්වසය අතපත ගැමට නොහැකි තරමට සිත ආකුල ව්‍යාකූල වෙමින් තිබිණි. ඔහු පින්සල තීන්ත බඳුනක ඔබා දුම් වැටියක් අතට ගත්තේ ය. ගිනිපෙට්ටියේ ගිනිකුරු අවසන්ව තිබුණෙන් ඔහුගෙ ' දුම්වැටියේ තුඩට තුඩ දල්වා ගැනීමට සිත්තරාට සිදු විය.

එවර දෙදෙනාම සැටි පුටුවට බර වී පොල්කටු අළු බඳන මැදින් තබා ගත්ත. සිත්තරා ව්‍යාකූල ආශ්වාදයකින් පසු වූයේ කතාවේ ඉතිරිය නික්ම එන තුරුය.

“එක්තරා දවසක බිරිඳ නැත්නම් පෙම්වතිය අතුරුදහන් වෙනවා. ගිමන් හරින්නා ඔහුගෙ ' මිත්‍ර අග්වයා පිට නැගිලා මුළු ලෝකෙම දෙවනත් කරමින් තමන්ගේ ප්‍රේමය හොයනවා. ඒත් ඒක නෑ. නැතිවෙලා. නැත්තට ම නැතිවෙලා. ඔහු ඒක දන්නේ නෑ. ඔහුට වෙහෙසයි අග්වයටත් වෙහෙසයි. මේ දෙන්නා ඇත්තට ම ඉසුරුමුණියට එන්නේ ගිමන් හරින්න. මිත්‍ර සිත්තරා මුණ ගැහිලා හිත නිවා ගන්න. ඔහු එක්ක කතා කරන්න. වේදනාව බෙදා ගන්න. කලාකරුවො සංවේදි බව ගිමන් හරින්නා දන්නවා. ඒත් මොකද වෙන්නේ ”

සිත්තරා සැටියෙන් නැගී සිටියේය. පොත් රාක්කය පාමුල තිබූ ගල් බෝතලය ගෙන විදුරු දෙකකට වත් කරලී ය. සැර බාල කිරීමට කිසිවක් නොතිබුණෙන් ශීතකරණය ඇර අයිස් කැට කිහිපය බැගින් විදුරු දෙකට දැමී ය. අයිස් කැට අරක්කු දියෙහි පාවෙන ඇසිල්ලේ ම ඉන් එක් විදුරුවක් හිස් කර දැමූ සිත්තරා යළිත් බෝතලය ඒ තුළට ඇලකර සිද්ධිය අසලට පිය නැගී ය.

“ගිමන් හරින්නාගෙ බිරිඳ නැත්නම් පෙම්වතිය මහනෙල් විලේ කිමීදෙමින් දිය නානවා. සිත්තරා ගල්තලාවකට වෙලා ඇවෙ රස විඳිනවා. ඇත්තටම සුන්දරයි. ඇත්තටම මේ තමාගේ බිරිඳ නැත්නම් පෙම්වතිය කියලා නොහිත ඒක රස විඳිනවා නම් ඇත්තටම සුන්දරයි. ඇත්තටම ගිමන් හරින්නා හිතුවෙත් එහෙම. ඔහුගේ හිත ඇතුළෙ මමංකාරය දෝංකාර දුන්නේ නෑ. ගිමන් හරින්නාගේ දෑස කඳුළින් බර වුණත් උපේක්ෂාව ගිගුම් නැගිලා කඳුළු වියලිලා ගියා. මොකොතෙන් ඒ දෑසෙ ඉතුරු වුණේ විරහව. ඒත් ඒක නිව්වච විරහවක් ගිමන් හරින්නාගෙ මේ මුනිවර සෙයියාව සිත්තරා දැක්කා. ඔහුගෙ හිත කම්පා වුණා. ඒත් ඔවුන්ගෙ ප්‍රේමයට බාධා කිරීමට ගිමන් හරින්නා මොහොතක්වත් නතර වුණේ නෑ. ඔහු අග්වයා මත නැගලා නික්මුණා ”

දීර්ඝ සුසුමක් පිට කළ ඔහු අයිස් දියෙහි පෙගී ඇති අරක්කු වඩිය උගුරට හලා ගත්තේ ය.

“එච්චරද? ඉවරද? “ බොහෝ වෙලාවක් නිශ්ශබ්දතාවයේ ගැලී හුන් සිත්තරා තම ආතතිය පිට කර හැරී ය.

“අයිස් කැට ටිකක් ගෙනෙන් “ ඔහු පැවසීය. කියූ සැනින් නැගිට ගත් සිත්තරා ඔහුගේ අවශ්‍යතාව ඉටුකරලීය.

ඔහු තවත් අරක්කු වඩියක් ආමාශගත කොට ගනිමින් කතාවේ අවසානයට එළැඹුණි.

“ සිත්තරා තම මිත්‍රයාගේ සර්වකාලීන වූ පරිත්‍යාගය සදාතනික වන විදිහේ නිර්මාණ කළේ ඊට පස්සේ. ඒ එකක් තමයි මේ” ඔහු ඉසුරුමුණි ප්‍රේමයේ අනුරුව දැක්වීය. “අනික ගිමන් හරින්නා සහ අග්ව හිස. සිත්තරාගේ ප්‍රකාශනය තමයි ප්‍රේමය සදාතනික බව හරියට ගලේ කෙටුවා වගේ. ඒ වගේමයි මිත්‍රත්වය. ඒකත් ගලේ කෙටුවා වගේ“ ඔහු සාක්කුවෙන් ඇද ගත් ලේන්සුවෙන් මුහුණ පිසදාලීය. දෑස් අග නලියමින් තිබූ තෙතමනයන් ලේන්සුව තුළ අතුරුදහන් විය.

“තව එකම එක විනුහයක් තියෙනවා. ගිමන් හරින්නා සහ අග්ව හිස ගැන“ ඔහුගේ කටහඬ අයිස් වලටත් වඩා සීතල වී තිබුණි. “පෙමි යුවලගෙ නිර්මාණයට වඩා විශිෂ්ට ගිමන් හරින්නාගෙ එක. ඒකෙ සම්පූර්ණයෙන් ම පිරිලා තියෙන්නේ මුනිවර ලක්ෂණ. හරියට සිද්ධාර්ථ කුමාරයයි කන්ථක අග්වයයි වගේ. කන්ථකගේ ළය පැලෙන්නේ සැබෑ මිත්‍රත්වය වෙනුවෙන්. අන්න ඒක සංඛේතගත කරන්න තමයි අග්ව හිස කෙටුවේ“

මිත්‍ර සිත්තරා තම සුරතින් කෙස්ස ඇද ගනිමින් සිටියේය. ඔහුගේ හදවත පශ්චාත් නූතන සිත්තමක් සේ ව්‍යාකූලව තිබුණි. ඔහුගෙන් මීළඟට කුමක් අසන්නදැයි නොදැන සිහිවිලි අතර අතරමං විය. මානසික ආතතියට එරෙහිව දුම්වැටියක් දල්වා ගැනීමට ගිනිකුරක්වත් නොවූයෙන් තව තවත් අසරණ විය.

කෙසේ හෝ සිහි එළවා ගත් සිත්තරා ඔහු අපහසුතාවට ලක් නොකරන සිතින් එහෙත් තීරණාත්මක ප්‍රශ්නය ඇසීය.

“උඹ කොහොමද මේවා මේ තරම් හොඳින් දන්නේ “

ඔහු සැහැල්ලුව මදහස නැගීය.

“මං තමයි ගිමන් හරින්නා “

8

ඇතුළතින් අගුළු ලෑ සිත්තරාගේ එකම කාමරයේ දොර ‘ඔහු’ නික්ම ගොස් ගිය පසුත් නොඇරැණි. සිත්තරා දොරට සත් නොකොටම බෝතලය හිස් කිරීමට පටන් ගත්තේ ය. අයිස් අහවරව තිබුණෙන් ඇල්කොහොල් ආමාශගත වූයේ අමුවෙනි. එය එතරම් සැරක් නොවූයේ වඩා වැඩි සැරකින් හිස ආතුරව තිබුණු බැවිනි.

අන්ධකාරය ජනෙල් අතරින් මිරිකි මිරිකී සාලය ආක්‍රමණය කරමින් තිබුණි. එහෙත් සිත්තරා විදුලි බුබුලකුදු නොදල්වා ම සැටියේ ඇල වී සිටියේ ය.

හෝරාවක් පමණ ඉක්ම යන්නට ඇත . ‘ටකස් ' ගා අගුළ ඇරී කාමරය විවෘත වූ නමුත් සිත්තරා හිසොසවාවත් බැලුවේ නැත . සාලයේ දොර ඇරී යළි වැසී ගියෙන් ඇ අන්ධකාරයේ ම නික්ම ගිය බව සිත්තරාට වැටහුණි.

වෙරි මරගාතයේ ම ටිපෝව අතපත ගෑ ඔහුගේ අතට ගිනි පෙට්ටිය හසු විය. එය විවර කොට ඇඟිල්ලක් ඔබා බැලූ නමුත් එක කුරකුදු එහි නොවීණි.

සිත්තරා දෙපසට වැනෙමින් කඩය දෙසට පිය මැන්නේ දොර නොවසා ම ය. සිත්තරා රැගෙන ආවේ ගිනිපෙට්ටියක් පමණි.

අන්ධකාරය තුළම සිටිමින් ඔහු සාලය මැද වූ සිත්තමේ කඩ තිර ඉරා දමා කැන්වසය ගලවා අතට ගත්තේ ය. මීදුලට ඇද දැමූ සිත්තමේ අග්ගිස්සට ගිනි තැබුණි.

වේදනාවෙන් විලාප නගනා “ඔහු” ගේ බිරිඳගෙ ' නිවේදන කටහඬ මීදුල දෙසින් නැගී ආයෙන් සිත්තරා ගෙතුළට වැද දොර වසා දැමී ය.

සිත්තර කලවයේ හැපුණු මෙසය මත තැබූ සීන්ත භාජනයක් සාලය මැද පෙරලී ගියේ ය. වහා සීන්තියට බර වී බිත්තිය අතගාමින් ඉදිරියට ගිය සිත්තරා සාලයේ විදුලි ස්විචය සොයා ගත්තේ ය.

පලා යන අන්ධකාරය විනිවිදිමින් සැටි කොණක ගිමන් හරින්නාගේ නිවුණු විරහී දෑස දැල්වෙමින් තිබුණි.

-